දරුවන් උදෙසා
බයිබලයක්

# ජේසුස් වහන්සේ අන්ධයෙකු සුව කරන සේක



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Janie Forest
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

බර්තිමේයුස් පෙරිකෝව අසල පාර අයිනේ වාඩි වී සිටි අන්ධ මිනිසෙකි. ඔහු කළේ සිඟමන් යැදීමය. සමහර කාරුණික අය ඔහු පසුකර යන විට ඔහුට කුඩා කාසියක් හෝ කෑමට යමක් දෙන්නට ඇත. බර්තිමේයුස්ට පෙනීම නොමැති වූයෙන් ඔහුට වැඩ කිරීමට නොහැකි වූයේය. ඔහුට කළ හැකි වූයේ සිඟමන් යැදීම පමණි.



එක් දිනක් මාර්ගය කාර්යබහුල විය. බර්තිමේයුස්ට අඩි ශබ්ද බොහොමයක් ඇසුණි. අසාමාන්‍ය දෙයක් සිදුවෙමින් පැවතුණි. වැඩි වේලා නොගොස් අන්ධ මිනිසා එය කුමක්දැයි දැනගත්තේය. නාසරෙත්හි ජේසුස් වහන්සේ නුවරට පැමිණ සිටිසේක. උන්වහන්සේ දකින්නටත්, උන්වහන්සේට ඇහුම්කන් දෙන්නටත් බොහෝ ජනකායක් රැස්ව සිටියෝය.





“ජේසුස් වහන්ස, දාවිත්ගේ පුත්රය, මට අනුකම්පා කළ මැනව!” බර්තිමේයුස් කෑගැසුවේ මන්ද? ජේසුස් වහන්සේට ඔහුට පිහිට විය හැකියැයි ඔහු සිතුවේ මන්ද? සමහරවිට ජේසුස් වහන්සේ සුව කළ අය ගැන ඔහු අසා තිබුණා විය හැකිය. ඔවුන් අතර සමහරෙක් බිහිරි, ගොළු, ආබාධිත සහ ඔහු මෙන් අන්ධ අය වූවෝය. “දාවිත්ගේ පුත්රය, මට අනුකම්පා කළ මැනව” බර්තිමේයුස් නැවත නැවතත් කෑගැසුවේය. ඔහුගේ කටහඬ බලාපොරොත්තු සහගත වූයේය.



බර්තිමේයුස්ට එක්
දෙයක් ගැන විශ්වාසය
තිබුණි. ඔහුට මේ
මොහොතේ උදව්
නොලැබුනේ නම්,
ඔහුට තවත්
අවස්ථාවක්
නොලැබෙනු ඇත.
ජේසුස් වහන්සේ
නැවත කිසි දිනෙක
ඔහු සිටින මාර්ගයේ
නොයනු ඇත.



බර්තිමේයුස්ට
ජේසුස් වහන්සේ
වෙත ළඟා වීමට
අවශ්‍ය වුයේය.
ඒත් මිනිස්සු ඔහුට
ඉඩ නොදුන්නෝය.
“නිශ්ශබ්ද වෙව!”
ඔවුහු කීවෝය.
නිහඬව සිටින
ලෙස ඔවුහු ඔහුට
අවවාද කළෝය.



නමුත් බර්තිමේයුස් නිහඬව
නොසිටියේය. ඔහු නොනවත්වා
කෑගැසුවේය. හදිසියේම ජේසුස්
වහන්සේ නැවතුණු සේක! සවන් දුන්
සේක! අන්ධ මිනිසා උන්වහන්සේ වෙත
ගෙන එන ලෙස අණ කළ සේක! “සතුටු
වන්න” කියා ජනතාව
බර්තිමේයුස්ට
පැවසුවෝය.
“නැගිටින්න.
උන්වහන්සේ
ඔබට කතා
කරන සේක.”



බර්තිමේයුස් තම වස්ත්‍රය පසෙකට දමා නැඟිට ජේසුස් වහන්සේ වෙතට පැමිණියේය.



“ඔබට මා කුමක් කළ යුතුද?” ජේසුස් වහන්සේ ඇසූ සේක. ඔබ ඊට පිළිතුරු දෙන්නේ කෙසේද? ඔබ බොහෝ මුදල් හෝ ලස්සන අලුත් ඇඳුම් ඉල්ලා සිටීවිද? බර්තිමේයුස්ට අවශ්‍ය වූයේත් ඒවාමද?



නැත, අන්ධ බර්තිමේයුස් ජේසුස් වහන්සේගෙන් රන් හෝ ලස්සන ඇඳුම් ඉල්ලුවේ නැත. ඔහුට අවශ්‍යව තිබුණ දේ ඔබ දන්නෙහිය. “ස්වාමීන් වහන්ස, මට පෙනීම දුන මැනව”. බර්තිමේයුස්ට පෙනීම අවශ්‍ය වූයේය! ගස්, කුරුල්ලන් සහ දෙවියන් වහන්සේගේ මැවිල්ලේ සියලු අලංකාරය දැකීමට ඔහුට අවශ්‍ය වූයේය. සිඟන්නෙකු නොවී ජීවත් වීමට ඔහුට අවශ්‍ය වූයේය.



ඉක්බිති ජේසුස් වහන්සේ බර්තිමේයුස්ට මෙසේ වදාළ සේක:
“පෙනීම ලබන්න, ඔබේ ඇදහිල්ල ඔබව ගළවාගත්තේය”.



එකෙණෙහිම ඔහුට පෙනීම ලැබී ජේසුස් වහන්සේ පසුපස ගියේය. ඔහු “දෙවියන් වහන්සේ පුදුමාකාරය! උන්වහන්සේ මාව සුවපත් කළ සේකැ” යි කීවේය. එය බර්තිමේයුස්ට ලැබුනු අපූරු අවස්ථාවක් විය.





එය දුටු සියලු මිනිස්සු
දෙවියන් වහන්සේට
ප්රශංසා කළෝය. නැවත
වරක්, දෙවියන් වහන්සේගේ
පුත්රයා වන ජේසුස්
වහන්සේගේ විශ්මිත බලය,
දුප්පත් අන්ධ යාචකයෙකුට
පෙනීම ලබා දුන් ආකාරය
තුළින් ඔවුන් දුටුවෝය.

# ජේසුස් වහන්සේ අන්ධයෙකු සුව කරන සේක

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ශු. මාර්ක් 10, ශු. ලූක් 18, ශු. යොහාන් 9

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය 119:130**

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදු අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)